# ඇත්තෝ සුවපත්වන.... නැත්තෝ දුක්විඳින..... අපේ රටේ වෛද්‍ය සේවය

අපගේ මතකයට අනුව අප කුඩා අවධියේදී යම් කෙනෙකු අසනීප වූ කල ප්‍රතිකාර සඳහා මුලින්ම යන්නේ ගමේ වෙද මහතා වෙතටය. ගමේ වෙද මහතා වෙත ගම්මුන් තුළ වූයේ සෑහෙන විශ්වාසයක් හා ගෞරවයකි. වෙදමහතා අතින් ලියැවුණු කසාය වට්ටෝරුවක් හෝ ගෙදර පිටුපස වූ ඔහුගේම වෛද්‍යාගාරයේ සංකලනය කරන ලද කල්ක ගුළියක් හෝ අරිෂ්ඨ බෝතලයක් හෝ ලබාදුන්නේ හුදෙක් මුදල් බලාපොරොත්තුවෙන් නොව රෝගියාගේ අසනීපය නිට්ඨාවටම සුවකිරීමේ පරම චේතනාවෙනි. ඔහුගේ එම සේවාවට ගාස්තු වශයෙන් බුලත් කොළයක තබා කිසියම් පඩුරක් දීම එකල සාමාන්‍ය සිරිත වීය. වෙද මහතා එම පඩුරද කැපකළේ බෙහෙත් තෙල් සිදීමට, අරිෂ්ඨ වර්ග පෙරාගැන්මට අවශ්‍ය බෙහෙත් බඩු හා බෙහෙත් පැළැටි සම්පාදනය කරගැන්මටය.

මේ කාලයේ ගම්වලට ආසන්න නාගරිකයේ බටහිර ක්‍රමයට අනුව බෙහෙත් කරන දොස්තර මහත්වරුද වූහ. ගමේ වෙද මහතුන්ට වඩා වෙනස් විදියට රෝග නිවාරණය කර ඊට සුදුසු ප්‍රතිකාර සහ බෙහෙත් ලබා දීමට අවශ්‍ය දැනුම සහ පහසුකම් ඔවුන් සතුව තිබුණි. එම දොස්තර මහතුන්ද සිය සේවය ලබාදුන්නේ ඉතා සුළු මුදලකටය. එකල මෙම වෛද්‍ය ක්‍රම දෙවිධිය අතර කිසිදු තරඟයක් තිබුණේ ද නැත.

ඊටත් අමතරව ඒ යුගයේ සිංහල සහ ඉංග්‍රීසි නොහොත් බටහිර ප්‍රතිකාර නොමිළේ ලබාදීම සඳහා පළාත්පාලන අධිකාරිය මගින් පිහිටවූ පින් බෙහෙත් ශාලා ද විය. ඒවා පින් බෙහෙත් ශාලා යනුවෙන් නම් කළේ කිසිදු ගාස්තුවක් නොගෙන ඕනෑම කෙනෙකුට නොමිළේ ප්‍රතිකාර ගැනීමට විවෘතව තිබූ නිසාය. මුදල් අගහිඟකමින් පීඩිත වූවන් අතර එම බෙහෙත් ශාලා අතිශයින් ප්‍රසිද්ධ විය. මේ කිසිම මාධ්‍යයකින් රෝගියාට නියම ප්‍රතිකාරයන් නොලැබුණා යයි සිතුනොත් රෝගියා නිතැතින්ම යන්නේ රජයේ රෝහල හෙවත් ආණ්ඩුවේ ඉස්පිරිතාලය වෙතය. රජයේ රෝහල්වල අද මෙන්ම එදාද සිටියේ විශේෂඥ වෛද්‍යවරුන් පිරිසකි. එසේම එකල රෝග විනිශ්චය සඳහා අවශ්‍ය නොයෙක් උපකරණ හා පහසුකම්ද එහි නොඅඩුව තිබුණේය. නමුත් නොමිළයේ ලැබුණු එම සේවය ලබා ගැන්මට රෝගියාට පැය ගණන් පෝලිමේ ඉන්නට සිදුවූ බව ද සඳහන් කළ යුතු ය. මෙම පෝලිම් ක්‍රමයෙන් බැහැරව අමතර මුදලක් ගෙවා රජයේ රෝහල්වල සේවයකරන විශේෂඥ වෛද්‍යවරුන් හමුවී එක්තරා අන්දමක පුද්ගලික ප්‍රතිකාර ලබාගැන්මේ චැනල්ක්‍රමය ආරම්භ වූයේ හැටේ දශකයේ අග භාගයේ බව මට මතකය. එයට අය කළ මුදලද එතරම් විශාල නොවූ අතර, එමගින් රජයේ රෝහල තුළම විශේෂ සැලකිලි හා අවධානය ලැබිණ. එකල රෝහලේ එම කොටස නම් කෙරුණේ ගෙවන වාට්ටු යනුවෙනි.

එදා සුළුවෙන් ආරම්භ වූ ඒ චැනල් ක්‍රමය අද මුළුමහත් ලංකාද්වීපය තුළ පිළිලයක් මෙන් පැතිරී ඇත. ඊටම සරිලන පෞද්ගලික රෝහල්ද ගම් නියම්ගම් සිසාරා බිම් හතුමෙන් බිහිවී තිබේ. මේ හේතූන් නිසා අද රජයේ රෝහල් වලට තැනක් නැත. ඒවායේ සේවය කරන දොස්තරලා ද දවසෙන් වැඩි කොටසක් ගතකරන්නේ පුද්ගලික රෝහල්වලය. උදේ සිට රෑවන තුරු එක් එක් රෝහලට යමින් කලින් මුදල් ගෙවා කාලය වෙන්කරගත් රෝගීන් ගැන බලති. සමහර අවස්ථාවල එකම කාමරයේ දෙපැත්තක ලෙඩුන් දෙදෙනෙකු පරීක්ෂාකිරීමේ සීඝ්‍රගාමී ක්‍රමයක්ද ඔවුන් යොදාගෙන ඇත. එතරම් මහා කරුණාවකින් මෙම දොස්තරලා රජයේ රෝහල්වල පෙළගැසී සිටින රෝගීන් පරීක්ෂාකරනවා අප මේ මෑතක දැක නැත. සමහර අවස්ථාවලදී රෝගියා කාමරයට ඇතුල්වන්නටත් කලින් බෙහෙත් තුණ්ඩුවද ලියා අවසානය. මෙච්චර වෙලා පෝලිමේ හිටියේ මෙච්චර සල්ලි ගෙවලා පැය ගණනක් රස්තියාදු වුණේ මේ තුණ්ඩු කෑල්ලටද? කියා කොඳුරමින් පිටව යන අසරණ අය අප කොතෙකුත් දැක ඇත. මේ අය මා මුලින් සඳහන් කළ පින් බෙහෙත් ශාලාවල පෝලිමේ සිටි උදවිය නොවේ. රුපියල් දහස් ගණනක් කලින් ගෙවා දොස්තර මහතා මුණගැසෙන්නට වෙන්කරගත් රෝගීන්ය. සමහර රෝගීන්ට පෝලිමේ ඉඳලාම ක්ලාන්තය සෑදේ. එයට ප්‍රතිකාර ලැබුණත් ඊටද ගෙවිය යුතුය.

අප දන්නා එක් කාන්තාවක් ලංකාවේදී මදුරුවෙක් දෂ්ඨ කිරීමෙන් කැසීම නිසා කකුලේ සෑදුණු කුඩා තුවාලයක් සඳහා පුද්ගලික රෝහලකට ඇතුල් වී සතියක් නැවතී සිටියාට දොස්තරගේ හා රෝහල් ගාස්තු වශයෙන් රුපියල් 80,000 ක් ගෙවන්ට ඇයට සිදු වීය. මදුරුවෙක් දෂ්ට කිරීමකට රුපියල් අසූදාහක් ගෙවන්නට සිදුවුනා නම් නාගයෙක් දෂ්ට කළොත් රුපියල් අසූ ලක්ෂයකින්වත් බේරෙන්නට ලැබෙන්නේ නැත.

වෛද්‍ය ප්‍රතිකාර සඳහා රජයේ රෝහලට යන රෝගීන්ද ලේ පිරික්සීම්, මළමුත්‍රා පිරික්සීම් සහ එක්ස්රේ ඡායා ලබාගැන්ම සඳහා යොමුකරන්නේ පුද්ගලික ආයතන වලටය. බොහෝ විට එම ආයතන වල කොටස්කරුවෝ ද ප්‍රසිද්ධ චැනල් දොස්තරවරු වෙති.

අද ශ්‍රීලංකාව තුළ පවතින වෛද්‍ය සේවාව ඇති අයට මිස නැති අයට නොවේ. හිතුමනාපයට රටේ ජනතාවගෙන් ලෙඩට ගාස්තු අයකරන වෛද්‍යවරුන්ට හිතක් පපුවක් ඇත්තේ දැයි යන්න සැකයකි. පපුව වවාගෙන කෑමේ කෙළවරක් නැත. පපුව රිදෙනවායයි කීවොත් බයිපාස් සැත්කමක් කළ යුතුයයි නියම කළ දොස්තරවරුද සිටිති. මුත්‍රා අමාරුවක් ගැන කිව්වොත් ඉවර වෙන්නේ වකුගඩුවක් බද්ධ කළ යුතුමය කියාය. ඒ වගේම හොඳට සල්ලි තියෙන අසාධ්‍ය ලෙඩෙක් අහුවුනොත් ඔහුට කීයටවත් මැරෙන්න ඉඩ දෙන්නේ නැත. කොහොම හරි තව ටික කාලයක් ජීවත් කරවන්න මේ දොස්තරලා පුල් වීරිය යොදති. අන්න! ඒවා තමයි පුණ්‍ය කර්ම! අනේ ඉතින් මේ චැනල් දොස්තරලා කරුණාවන්ත නැතැයි කිව හැක්කේ කාටද?

♦ විල්ෆ්‍රඩ් පෙරේරා Wilfred Perera - *Berkshire UK*



**ලංකාවේදී මදුරුවෙක් දෂ්ඨකර කැසීම නිසා කකුලේ සෑදුණු කුඩා තුවාලයකට ප්‍රතිකාර සඳහා කොළඹ පුද්ගලික රෝහලකට ඇතුල්වූ ලංකා කාන්තාවකට සතියක රෝහල් ගාස්තු සහ දොස්තර ගාස්තු වශයෙන් රුපියල් 80,000 ක් ගෙවන්ට සිදු වීය. මදුරුවෙක් කාලා එහෙම නම් නයෙක් දෂ්ට කළොත් කොපමණ ගෙවන්නට වේද?**

## Private healthcare Sector - Surgical Packages at Lanka Hospitals Plc

| Name of Surgery | Charges | Surgery | Charges |
|---|---|---|---|
| Tonsils Surgery | Rs: 46,000 | Child Birth - Normal delivery | Rs. 30,000 |
| Ear Surgery | Rs. 38,500 | Cesarean delivery | Rs. 43,500 |
| Ear Bone repair | Rs. 30,000 | Examination of Womb | Rs. 37,500 |
| Nose Septum | Rs. 44,000 | Ovary Cyst Removal | Rs. 49,000 |
| Ear Drum repair | Rs. 40,000 | Urine flaw Test | Rs. 11,000 |
| Appendix Surgery | Rs. 48,000 | Womb wash | Rs. 12,500 |
| Circumcision | Rs. 11,500 | Birth Control Surgery | Rs. 24,000 |
| Piles Surgery | Rs. 87,000 | Carpel Tunnel Release | Rs. 13,500 |
| Hernia repair | Rs. 30,000 | | |
| Gallbladder removal | Rs. 46,000 | | |
| Womb removal | Rs. 56,000 | | |
| Womb Repair | Rs. 31,500 | | |
| Breast Surgery | Rs. 53,000 | | |
| Thyroid Surgery | Rs. 56,000 | | |
| Kidney stone removal | Rs. 70,000 | | |

Above details are from the website published by
**Lanka Hospitals Corporation Plc**
578 Elvitigala Mawatha
Narahenpita, Colombo 5
**www.lankahospitals.com**

## ආරෝග්‍යා පරමා ලාභා!

**මේ** පිටුවේ පසෙක ඉංග්‍රීසියෙන් දක්වා ඇති ලැයිස්තුව දෙස බලන්න. එහි පෙන්නා ඇත්තේ අද දවසේ ශ්‍රීලංකාවේ පුද්ගලික රෝහල්වල රෝගීන්ගෙන් අයකරන මුදල් ප්‍රමාණයන්හි මිළ දර්ශනයයි. රෝගයේ නමද, ඒ රෝගය හෝ ආබාධය සුවකිරීමට කෙරෙන ශල්‍යකර්මයන් සඳහා අය කරන ගාස්තුව ද එහි වෙයි. ගාස්තු දෙස හොඳට කල්පනාවෙන් බැලුවහොත් එහි රුපියල් දාහකින් කර ගත හැකි කිසිවක් නැති බව ඔබට පෙනෙනවා ඇත. කනක ආබාධයක් නිවැරදි කිරීමට රුපියල් 38,000 කි. උගුරේ සෙම් ගෙඩියක් ඉවත් කිරීමට රු 46,000 කි. හර්නියා අරන් දාන්නට රු 30,000 කි. අර්ශස් ඔපරේෂන් එක රුපියල් 87,000 කි. මුත්‍රා බොක්කේ ගල් අරන් දැමීමට රුපියල් 70,000 කි. සමාන්‍ය දරු ප්‍රසූතියකට රු 30,000ක් වන අතර සිසේරියන් සැත්කමක් නම් රු 43,500 කි. කොටින්ම මුත්‍රා පරීක්ෂණයකටත් පුද්ගලික රෝහලකට ගියොත් රුපියල් 11,000 ක් වැය වෙන්නේ ය. මේ ගණන් අපේ රටේ සාමාන්‍ය මහ ජනතාවට උහුලන්නට පුළුවන් ගණන් ඉලක්කම්ද යන්න මඳකට හිතන්න.

ටික කලකට ඉහත වන තුරු ඉහතකී ප්‍රතිකාර හා ශල්‍යකර්ම ආදිය මහජනයා වෙනුවෙන් කෙරුණේ කොළම ඇතුළු ප්‍රධාන නගරවල මහ ඉස්පිරිතාලවලිනි. ඒ සියළු සේවා දැන් බාරගෙන ඇත්තේ දොස්තර වෙසින් පෙනී සිටින මෙඩිකල් මුදලාලිලා ය.

මහ ඉස්පිරිතාලයේ වැඩ කරන දොස්තරම හවසට පුද්ගලික රෝහලට දුව ගොස් ගරානා කෝට් එක ඇඳ ග්ලවුස් අත්වලට දමාගනී. දැන් එතන ඉන්නේ සූරාකන්නෙකි. මෙපමණ තාක්ෂණය වෛද්‍ය විද්‍යාව දියුණු ලෝකයේ ජනතා සේවක දොස්තර කෙනෙක් ලංකාවේ ඇහැටවත් දකින්නට නැත.

ඔවුන් ජනතාවට දෙන පණිවුඩය මෙයයි. " මුදල් ගෙවපල්ලා... නැත්නම් ඉතින් වැලිගම පලයල්ලා.....!

♦ **වෙනුර**

HolidayAir
A Travel Experience to Remember
The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value Deals to Colombo
OMAN AIR £215 +Taxes 30th Jun 2012
KUWAIT AIRWAYS £275 +Taxes 30th Jun 2012
JET AIRWAYS £295 +Taxes 30th Jun 2012
ETIHAD £305 +Taxes 01st – 30th July 2012
QATAR AIRWAYS £325 +Taxes 01st – 30th July 2012
SriLankan £395 +Taxes 01st – 30th July 2012
Emirates £550 +Taxes from Heathrow, Gatwick, Birmingham, Manchester 01st Jun – 10th July 2012
Flights to Sri Lanka on SriLankan
We will not be beaten on Price!
That's a promise!
If you find a cheaper quote from
Any agent
Any day
Any class
WE WILL DOUBLE THE DIFFERENCE!
Terms and conditions apply.
0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm
Skype us on holiday.air
facebook Holidayair Holidays
ATOL PROTECTED
IATA
MCG